# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.19 පැය 0100 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1910/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## ශ්‍රී ලංකා පොලිසිය සංවිධානය කරනු ලැබූ දීපවාලි උත්සව සැමරුම.

2025.10.20 වන දිනට යෙදී ඇති දීපවාලි උත්සවය නිමිත්තෙන් ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් බෞද්ධ හා ආගමික කටයුතු සංගමය මඟින් සංවිධානය කරනු ලැබූ දීපවාලි උත්සවය 2025.10.18 වන දින සවස් කාලයේ **බම්බලපිටිය කදිරේෂන් කෝවිල් නව උත්සව ශාලාවේදී විදේශ කටයුතු හා විදේශ රැකියා ගරු නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍රන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාගේ සහභාගිත්වයෙන්** පැවැත්විණි.

මෙහිදී හින්දු ආගමික පූජකතුමන්ලා විසින් දීපවාලි උත්සවය වෙනුවෙන් විශේෂ ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව දීපවාලි උත්සව සැමරුම ආරම්භ විය. මෙම අවස්ථාව පොලිස් සංස්කෘතික කොට්ඨාසය හා බම්බලපිටිය නිර්මලාංජලී නර්ථනායතනයේ නර්ථන කණ්ඩායම් විසින් උත්සව අවස්ථාව හින්දු සංස්කෘතික නර්ථන අංගයන්ගෙන් වර්ණවත් කරන ලදී.

මෙම අවස්ථාව සඳහා මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පරිපාලන මාලිකා සූරියප්පෙරුම, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සංවර්ධන දමයන්ති කරුණාරත්න, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් පතිනායක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න, පොලිස් මාධ්‍ය ප්‍රකාශක එෆ්.යූ. වුට්ලර් යන මහත්ම මහත්මීන් ඇතුළු විශ්‍රාමික හින්දු භක්තික උසස් පොලිස් නිලධරයන් හා දිවයිනේ සියළුම පොලිස් කොට්ඨාස නියෝජනය කරමින් හින්දු භක්තික පොලිස් නිලධරයන් රැසක්ද සහභාගි විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප
















Hall













පොලිස් මාධ්‍ය කොට්ඨාසය.